විශිෂ්ටයන්ගේ අතිවිශිෂ්ටයන් බිහිකරන පාඩම් මාලාව **14**

බුද්ධි කලම්බනයක නව්මු මඟ

ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත තරඟ විභාගය

මෙම පාඩම් මාලාව පහත සඳහන් විෂයයන් හතරම ආවරණය කරනු ලබයි. සාමාන්‍ය බුද්ධිය, සාමාන්‍ය දැනීම, රචනය හා සාරාංශය, කළමනාකරණ අභියෝගතාවය, මෙම විෂයයන් ප්‍රශ්න පත්‍ර හතරක් ලෙසින් පහත පරිදි විභාගයට ලැබේ.
සාමාන්‍ය බුද්ධිය කාලය පැය 1 යි - බහුවරණ ප්‍රශ්න 50 යි ලකුණු 100යි
සාමාන්‍ය දැනීම කාලය පැය 2යි බහුවරණ 50 යි, වනුගතව 25 යි ලකුණු 100යි
රචනය හා සාරාංශය කාලය පැය 2 යි රචනය වචන 200කි, සාරාංශයක් ලෙසු ලකුණු 100යි.
කළමනාකරණ අභියෝගතාවය කාලය පැය 2 යි බහුවරණ 50යි වනුගතව 25 යි ලකුණු 100 යි.

සාමාන්‍ය බුද්ධිය - 5

1. A B C යන යාලුවෝ ඒදෙනෙක් සිටිති. ඔවුන් තම් කළ පිළිවෙළින් වේවා හෝ නොවේවා ඉන් එක් අයෙක් ලියන්නෙකි. එක් අයෙක් බඹර් කෙනෙකි. අනිකා වෙළෙන්දෙකි. ඔවුන්ගේ රැකියාවන් සඳහන් කරන්නැයි කියනු ලැබූ විට ශිෂ්‍යයෙක් මෙසේ කීය A ලියන්නාය. B ලියන්නා නොවේ' (බඹර් නොවේ. ශිෂ්‍යාගේ ප්‍රකාශය වලින් එකක් පමණක් හරි නම්, එක් එක් අයකුගේ රැකියා සඳහන් කරන්න.
I A = ...II B = ...
III C = ...

2. අනිල්, විමල්, සුනිල්, පියල් හා දිනිල් ද එක්තරා ලොරියක්, බසයක් හා කාරයක් යන වාහනවලින් එකක් හෝ වැඩි ගණනක අයිතිකරුවෝ වෙති. සුනිල් හා දිනිල් ද බසයක අයිතිකරුවෝ වෙති. පළමු හකර දෙනාගෙන් එක් අයෙකුට බසයක් පමණක් සහ නවන් එක් අයෙකුට කාර් එකක් පමණක් ද අයිතිව ඇති අතර ඔවුන් අතුරින් බසයක් අයිති එක් අයෙකුට ලොරියක් ද අයිතිව ඇත.
පියල්ට බසයක් හෝ ලොරියක් අයක් නොවේ. විමල්ට හා සුනිල් ට ලොරියක් ද, නවන් එක් වාහනයක්ද අයිතිව ඇත. දිනිල්ට අයත්ව ඇත්තේ, සුනිල්ට අයත්, එහෙත් විමල්ට අයත් නැති වාහනය හෝ වාහන වේ. එක් අයෙකුනාට අයිති වාහනය හෝ වාහන ලියන්න.

I අනිල්ට..... I සුනිල්ට..... III පියල්ට.....
IV විමල්ට..... V දිනිල්ට.....

3. බස් පෝලිමක විල්සන්, සේන, රංජිත්, ලයනල් සහ කුමාර සිටිති. රංජිත් සිටින්නේ සේනට ඉදිරියෙනි. ලයනල් සිටින්නේ විල්සන්ට පිටුපසිනි. කුමාර සිටින්නේ විල්සන්ට ඉදිරියෙන් නමුත් සේනට පිටුපසිනි.
I පෝලිමේ ඉදිරියෙන් සිටින්නේ කවුද ?.....
II පෝලිමේ මුල සිට තුන්වෙනියා කවුද ?.....

4. මිනිමැරුමක වරදකරුවන් යැයි සැකකරනු ලැබූ පස් දෙනෙකුගෙන් මිනිමැරුම සිදු වූ දින දවල් හා හවස් කාලයේදී තමන්ගේ හා තමන් දන්නා හැටියට අනෙක් අයගේ හැසිරීම පිළිබඳ පොලීසිය විසින් විමසන ලදී ඔවුන්ගේ පිළිතුරු පහත දැක්වේ.
වරදකරුවා බොරුකී අතර අනෙක් සියලු දෙනාම ඇත්ත කීවෝය. සිල්වා – මම දවල් (පෙරේරා සමඟ චිත්‍රපටියක් බලා) ගෙදර සිටියෙමි. ප්‍රනාන්දු : මා දවල් වරුව පුරාම කළේ කොළඹය. එහිදී බස් රථයක යන පියදස දුටුවෙමි.
පෙරේරා : මම දවල් තනියම චිත්‍රපටියක් බලා ගුණපාල සමඟ සවස ගත කළෙමි.
පියදස :- මම මුළු දවසෙම කොළඹ සිටියෙමි එහෙත් කිසිවෙකු දුටුවේ නැත.
ගුණපාල :- මම දවල් වරුව කොළඹ සිටියෙමි. එහිදී ප්‍රනාන්දු දුටුවෙමි. එහෙත් ඔහු මා දුටුවේ නැත.
(මා හවස පුරා කළේ පෙරේරා සමඟය) අනික් අය පුරා මම නොදනිමි.

I ඉහත සඳහන් සාක්ෂි උපකල්පනය කොටගෙන වරදකරුවා කවුරුන්දැයි නිශ්චය කරන්න.....

IIමෙහි වරහන් තුල ඇති වචන සිල්වා හා ගුණපාල නොකී බවද, කොළඹ දී චිත්‍රපටි ශාලාවකට සිල්වා ඇතුළු වනු කෙණ දුටු බව ප්‍රනාන්දු වැඩිදුරටත් කී බවද සැලකූවා හොත් මිනීමරුවා කවුරුන් විය හැකිද?.....

5. චිත්‍රසේන, ගුරුසිංහ හා නිහිචන්ද්‍ර යන ශිෂ්‍යයෝ චිත්‍ර ශිල්පියෙක්, පුහුණු ගුරුවරයෙක් හා නිහිඳයෙක් ද වෙති. එහෙත් ඒ අනුපිළිවෙළට නොවේ. චිත්‍රසේන නිහිඳයාගේ ඔස්සිනා වන අතර, චිත්‍ර ශිල්පියා සමඟ අමහරසයෙන් සිටී නිහිචන්ද්‍ර කිසි කලෙක විහාරයක් පාස් කොට නැත. ශිෂ්‍යාගේ වෘත්තීන් සඳහන් කරන්න.
I චිත්‍රසේන.....
II නිහිචන්ද්‍ර.....
III ගුරුසිංහ.....

6. රමණී කමනට වඩා ගණිතයට දක්ෂය. ගණිත පරීක්ෂණයේ දී නිමලා රමණීට වඩා ලකුණු ලබා-ගත්තාය. ලාලනිට සුම විටම කමනිට වඩා ගණිත විෂයට ලකුණු ලැබේ.
I මොවුන් අතුරින් ගණිතයට ඉකමක් දක්ෂ කවුද ?.....
II ගණිත පරීක්ෂණයේදී 3 වැනි ස්ථානය ලැබීමට ඉඩ ඇත්තේ කාටද ?.....

7. රාජාට වඩා සුනිල් උසය. පියදසට වඩා රාජා උසය. ජගත් සුනිල්ට වඩා මිටි නමුත් පියදසට වඩා උසය. මොවුන් අතුරින් මිටිම කවුද ?.....

8. රවුම් පිටවතියක් වටේ ඇති පාරක එකම සැතිත් පවත්ගෙන විපුල සහ සරත් එක් පැත්තකවත් සේන ඊට විරුද්ධ පැත්තවත් දුවන්න පටන් ගත්හ. රවුමේ භාගය පසුකලාට පසුව සරත්ට සේන මුණ ගැසුනි. විපුලට සේන මුණ ගැසුනේ රවුමෙන් භාගයක් දිවි-මටත් පෙරය.
I ඉකමත් වේගයෙන් දුවන්නේ කවුද?.....
II සෙමින් දුවන්නේ කවුද ?.....

9. විමලා, රමණී, කමනී, ඉන්දිරා හා චමර බංකුවක පිළිවෙළින් වමේ සිට දකුණට වාඩි වී සිටිති. පළමුව විමලා හා කමනිද, දෙවනුව කමනී හා චමරි ද තෙව-නුව රමණී හා ඉන්දිරා ද ස්ථාන මාරු කරගෙන වාඩි වූයේ නම් දැන් පේළියේ මැද සිටින්නේ කවුද ?
I.....

10. A, B, C, D හා E පෝලිමක සිටින්නේ පිළි-වෙළට නොව D සිටින්නේ B ට ඉදිරියෙනි. A ට පිටු-පසින් සිටින C ට පිටුපසින් D සිටී. E සිටින්නේ පේළිය අගවුවර B ට ඉදිරියෙනි.

I පෝලිමේ මැද සිටින්නේ කවු ද?
II පෝලිමේ මුල සිට දෙවැනියා කවුද?

මළඟ පාඩම බදාදා (12) පත්තේ පළවේ

ඉදිරිපත් කිරීම
අනුෂා ගෝකුල ප්‍රනාන්දු
අධ්‍යක්ෂ
බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

පිළිතුරු

1. A - බාබර් B ලියන්නා C - වෙළෙන්ද
මෙම ගැටලවේදී සිසුවා කරන ප්‍රකාශය තුළ සත්‍ය වන්නේ එක් ප්‍රකාශයක් පමණක් වග පැවසේ. එනම් අසත්‍ය ප්‍රකාශ දෙක ලෙස සැලකිය හැක්කේ A ලියන්නා බව පැවසීමත් B ලියන්නා නොවන වග පැවසීමත්ය. මන්ද සත්‍ය වශයෙන් ම A ලියන්නා නම් නැවත B ලියන්නා නොවන වග පැවසීම අත-වශ්‍ය ප්‍රකාශයකි. එනිසා එකම සත්‍යය ප්‍රකාශය වන්නේ C බාබර් නොවන බව පැවසීමයි. එසේනම් C යනු වෙළෙන්ද හෝ ලියන්නා විය යුතුය. එය මහසේ කළා ගෙන නැවත සාවද්‍ය ප්‍රකාශ දෙක විමසන කල B ලියන්නා නොවන බව පැවසීම තුළ ශත්‍ය වන්නේ B ලියන්නාම වන බවය. එසේනම් C වෙළෙන්ද වන අතර, A බාබර් විය යුතුය.

2. I බසයක් II ලොරියක් හා බසයක්
III කාරයක් IV කාරයක්, ලොරියක් V බසයක්
මෙම ගැටලවේදී දිනිල්, පියල්, සුනිල් සිදෙනාට තිබෙන වාහන මොනවාද යන්න ප්‍රකාශන තුළ පැහැදිලිව අන්තර්ගත වේ. එනිසා අනිල් සහ විමල් යන දෙදෙනාට තිබී වාහන මොනවාද යන්න වඩාත් කාර්කිකව විමසා බැලිය යුතුය.
දී ඇති ප්‍රකාශනය තුළ පළමු හතර දෙනාගෙන් එක් අයකුට බසයක් පමණක් හා තවත් එක් අයකුට කාරයක් පමණක් අයිති වග දක්වයි. කාරයක් පමණක් අයිති පුද්ගලයා පියල්ය. මන්ද ඔහුට බස-යක් හෝ ලොරියක් නොමැති වග දක්වෙයි. පළමු හතරදෙනා අතර සිටින සුනිල්ට ද බසයක් තිබෙන වග මුලින්ම කියවෙයි.
එමෙන්ම ඔහුට ලොරියක්ද තිබෙන වග තවත් වරෙක කියවෙයි. එනිසා බසයක් පමණක් තිබෙන්නා අනිල් හෝ විමල් විය යුතුය. එමනිසා විමල්ට ලොරියක් තිබී වග පවසන නිසා බසයක් පමණක් තිබී පුද්ගලයා අනිල් වේ.
විමල්ට ලොරියක් තිබෙන බව අපි දනිමු. සුනිල්ට හා විමල්ට ලොරියක් ද තවත් එක් වාහනයක් ද තිබෙන බව පැවසීම තුළ නම හොසඳහන් වාහන-යක්. එහි අයිතිකරුන් සොයා ගත යුතු ය. සුනිල්ට බසයක් ද තිබෙන බව සඳහන් නිසා මෙම නම හොසඳහන් වාහනය කාරය වේ. එමෙන්ම මේ වනවිට සුනිල් වාහන දෙකක තිබීකරු නිසා කාරය අයිති පුද්ගලයා විමල් බවද නිගමනය කළ හැකිය.

3. ලයනල්, විල්සන්, කුමාර, සේන, රංජිත් ඉදිරිපස දී ඇති විස්තරය ට අනුව පුද්ගලයන් පස්දෙනා පෙළගැස්වූ විට දිස්වන්නේ ඉහත ආකාරයටය.
I රංජිත් II කුමාර

4. මෙම ප්‍රකාශ සියල්ල හොඳින් කියවන විට පූර්ණ සැක සහිත බවත් හැමවෙන ප්‍රකාශ දෙක වන්නේ සිල්වාගේ ප්‍රකාශයයි. මන්ද ඔහු දහවල් පෙරේරා සමඟ චිත්‍රපටියක් බලා ගෙදර සිටී බව පැවසුවද පෙරේරා පවසනුයේ ඔහු තනිවම චිත්‍රපටියක් නැරඹූ වගත් ගුණපාල සමඟ සවස ගතකළ වගත්ය. පෙරේරාගේ ප්‍රකාශය සත්‍ය වග ගුණපා-ලගේ ප්‍රකාශයෙන් තහවුරු වේ. ඒ අනුව අසත්‍ය පැවසූ එකම පුද්ගලයා සිල්වාය. ඔහු මිනීමරුවා ලෙස නිගමනය කළ හැක.
දෙවන ගැටලවේදී වරහන් තුළ තිබුනු ද, ඉවත් කොට සිල්වා සහ ගුණපාලගේ ප්‍රකාශන සලකා බලන කළ අසත්‍ය පවසන්නේ පෙරේරා ලෙස කිව හැකිය. මන්ද පෙරේරා ගුණපාල සමඟ සවස ගත කළාය යන්න ගුණපාලගේ ප්‍රකාශයෙන් නොකියා-වෙන බැව්නි. එනිසා දෙවන ගැටළුවට අනුව මිනීම-රුවා පෙරේරාය.
I සිල්වා II පෙරේරා

5. I පුහුණු ගුරු II චිත්‍ර ශිල්පියා III නිහිඳයා
මෙම ගැටළුවට අදාළව දී ඇති විස්තරය අනුව චිත්‍රසේන නිහිඳයා හෝ චිත්‍ර ශිල්පියා නොවන බව තුන්වන වාක්‍යයෙන් පැහැදිලිව කියවේ. එසේ නම් ඔහු පුහුණු ගුරුවරයාය. නිහිඳයන් කිසිකලෙක විහාරයක් සමස්වනතු නිසා ඔහුට නිහිඳයකු විය නොහැක. එනිසා ඔහු චිත්‍ර ශිල්පියා වන අතර ගුරුසිංහ නිහිඳයා වේ.

6. I නිමලා II ලාලනී
දී ඇති විස්තරයට අනුව දක්ෂයන් පෙළගැස්විය හැක්කේ පහත ආකාරයටය.
නිමලා, රමණී, ලාලනී, කමනී
1 වැනියා 2, වැනියා 3, වැනියා 4 වැනියා

7. I පියදස
දී ඇති විස්තරයට අනුව මෙම පුද්ගලයන්ගේ උස ආරෝහන පිළිවෙළට සකස් කළ විට පහත පරිදි වේ.
පියදස - රාජා - ජගත් - සුනිල්

8. I සරත් II ෂපුල
වේගයෙන්ම දිවයන්නා සරත්ය. මන්ද ඔහුට සේන හමුවන්නේ රවුමේ එක් අර්ධයක් පසු කොට තවත් වීකක් දිව ගිය පසුය. ඒ වන විට සේන රවුමේ භාගයක් දිව ගොස් නොමැත. ඉකම සෙමින් දුවන්නේ විපුලය. මන්ද විපුලට අනෙක් පසින් දිව එන සේන මුණ ගැසෙන්නේ රවුමේ භාගයක්වත් දිවීමට පෙරය. ඒ වනවිට සේන රවුමෙන් 3/4ක් පමණ දිවගොස් හමාරය. සරත් පූර්ණ ලෙසම රවුම දිවගොස් හමාරය.

9. I විමලා
විමලා රමණී කමනී ඉන්දිරා චමරි
I කමනී රමණී විමලා ඉන්දිරා චමරි
II චමරි රමණී විමලා ඉන්දිරා කමනී
III චමරි ඉන්දිරා විමලා රමණී කමනී

10. I D II C
ගැටළුවේ දී ඇති විස්තරයට අනුව පුද්ගලයන් ඉදි-රිපස සිට පිටුපස දක්වා දකුණේ සිට වමට පෙළ-ගැස්වූ විට පහත පරිදි වේ.
B E D C A පෝලිමේ ඉදිරිපස

දිනමිණ පුවත්පත බබට ලබා ගැනීමේ අපහසුසා ඇත්නම් පුවත්පත් බෙදා හැරීමේ කළමනාකරු, 011 2429371, දුරකථන අංකයට හෝ 011 2429378 සහ 011 2429776 යන දුරකථන අංකයන්ට අමතා හෝ 011 2429470 යන Fax අංකයට දන්වා විස්තර ලබා ගන්න.

© 2010

Web2PDF
converted by Web2PDFConvert.com